**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

*******

**<u>පුවත්පත් නිවේදනය</u>**

**ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය සෑම පෝ දිනකදීම දිවයින පුරා විහාරස්ථානවලදී ප්‍රදර්ශනය කෙරේ**

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මැදින් පොහොය දිනය නිමිත්තෙන් කොළඹ ශ්‍රී සම්බෝධි විහාරස්ථානයේ දී බෞද්ධ ප්‍රදර්ශනයක් සංවිධානය කර තිබිණ. බුදුන් වහන්සේගේ ජීවිතයේ වැදගත් සිදුවීම් සිදුවූ ස්ථාන සහ ඉන්දියාවේ වෙනත් වැදගත් බෞද්ධ සිද්ධස්ථාන දැක්වෙන ඡායාරූප රැසක් මෙහිදී ප්‍රදර්ශනය කෙරිණ. මෙම ප්‍රදර්ශනය අපගේ ගැඹුරු සංස්කෘතික සබඳතාවය සහ දෙරට විසින් බෙදාහදා ගන්නා පොදු උරුමය සහ ඉතිහාසය අවධාරණය කරයි. එසේම, මෙම ප්‍රදර්ශනය අප දෙරට අතර ජනතාවගේ බැඳීම් ඉහළ නැංවීමේ සහ අපගේ ඉපැරණි මිත්‍රත්වය සහ සහයෝගීතාවය ශක්තිමත් කිරීමේ අපගේ පොදු අරමුණ ද ප්‍රවර්ධනය කරයි.

2. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා අද දින ශ්‍රී සම්බෝධි විහාරයට පැමිණ ප්‍රදර්ශනය නැරඹීමට එක් විය. එතුමා ශ්‍රී සම්බෝධි විහාරයේ විහාරධිපති සහ 'බෞද්ධයා' නාලිකාවේ සභාපති පූජ්‍ය බෝරලන්දේ වජිරඤාන හිමිපාණන් සමඟ පූජාවකට ද සහභාගී විය.

3. මෙම ප්‍රදර්ශනය මහ කොමසාරිස් කාර්යාලය විසින් මෙම වසරේ සෑම පොහෝ දිනකදීම විවිධ විහාරස්ථානවල සංවිධානය කරනු ලබන ජංගම ප්‍රදර්ශන මාලාවක දෙවන ප්‍රදර්ශනය වේ. ප්‍රථම ප්‍රදර්ශනය 2024 පෙබරවාරි 23 වන දිනට යෙදුණු නවම් පුන් පෝ දින කළුතර බෝධියේදී පැවති අතර එය දහසකට අධික බැතිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍ර විය.

***

කොළඹ
2024 මාර්තු 24